## 2018 දෙසැම්බර් මස 03 වන දින සිට දෙසැම්බර් මස 09 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

### "ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ උපත මඟින් දේව රාජ්‍යය ලොවට උදාවූ වගයි..."

01. ප්‍රශංසාව සඳහා
 * (මීකා 5:2) "එම්බා බෙත්ලෙහෙම් එප්‍රාතා ! තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නෙහි ය. එහෙත්, ඉශ්‍රායෙල් කෙරෙහි අධිපතියා වීමට කෙනෙක් තී කෙරෙන් නැඟී එන්නේ ය." දිවැසිවරයා කී ලෙසම ධර්මයාණෝ මිනිසත් බව ගෙන මෙලොවට වැඩම කළ සේක. අප සමඟ වාසය කළ සේක.
 * නැතිවූ උරුමය වන දේව රාජ්‍යය ඔවුන් වහන්සේ අපට මෙසේ යළි උරුම කර දුන් සේක. දේව රාජ්‍යයේ ප්‍රේමයේ ලක්ෂණ අපි ඔවුන් වහන්සේ තුළින් දුටුවෙමු. එනම්, අත්හැරීමේ ප්‍රේමය, ඉඩදීමේ ප්‍රේමය, පාද සේදීමේ ප්‍රේමය හා පූජා වීමේ ප්‍රේමය මඟින් සමිඳාණෝ අපට විමුක්තිය උදා කර දුන් සේක.
 * අපගේ නමස්කාරය, ප්‍රශංසාව හා ස්තුතිය පුද කරමින් පුබුදු ගී අංක 178 ගායනා කරමු. "යුග ගණනක් පෙරුම් පුරා..."

02. සතියේ සුපුවත
 * අපි දැන් ආගමන කාලයට පැමිණ සිටිමු. ආගමනය යනු පැමිණීමයි. ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගත වීමේ අභිරහස මඟින් දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ රාජ්‍යය ලොවට උදාවූ වගයි.
 * ආගමන කාලයේ පළමු සතිය තුළ සභා මාතාව අපට ඉදිරිපත් කරන පණිවුඩය කෙරෙහි අපේ නෙත් සිත් යොමු කරමින් ශු. මතෙව් 7:21,24-27 දකවා ශු. ලියවිලි පාඨ කියවා සුබාරංචිය කුමක්දැයි සාකච්ඡා කොට බෙදා ගනිමු.

03. වචනයේ සේවකයා සඳහා
 * ඓතිහාසික නත්තල මඟින් ලොවට උදාවූ දේව රාජ්‍යය පුද්ගලයෙකු ලෙස, පවුලක් ලෙස, කිතුනු සංඝයක් ලෙස මෙන්ම පුබුදු ජනතාවක් ලෙස අත්දකින්නට මෙන්ම, අප ජීවත් වන විවිධ පරිසර තුළත්, සමාජ පරිසරය තුළද සාක්ෂි දැරීමට අපව අවදි කරනු ලබයි.
 * (1කොරෙන්ති 5:14-18) "... එබැවින් යමෙක් ක්‍රිස්තුන් වහන්සේ තුළ සිටී නම්, එතැන ඇත්තේ නව මැවිල්ලකි. පැරණි දේ පහව ගොස් ඇත. ....."
 * නත්තල හෙවත් බෙත්ලෙහෙමේ කිතු උපත, දැනුදු නිරතුරුම අප සමඟ වැඩසිටින ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි මෙන්ම, මහිමාලංකාරයෙන් මතු දින දේව රාජ්‍යය පූර්ණත්වයට පත් කරමින් වැඩම කරන සමිඳාණන් කෙරෙහි අපගේ නෙත්, සිත් අවදි කරන සමයයි මේ.
 * ස්වර්ග රාජ්‍යයේ ජීවිතය යනු ක්‍රිස්තුන් වහන්සේ සමඟ, ඔවුන් වහන්සේ තුළ,ඔවුන් වහන්සේ කරණකොට ගෙන ගත කරන ජීවිතයයි. ක්‍රිස්තුන් වහන්සේ තුළ ජීවත් වීම යනු ඔවුන්වහන්සේ කෙරෙන් නික්මෙන වචනය මඟින් එළිදරව් වන පියාණන්ගේ ශුද්ධවූ කැමැත්ත තුළ ජීවත් වීමයි, හැසිරීමයි, පැවතීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේ මඟින් පිළිතුරු දෙන ජීවිතයයි.

04. අප දෙස
 * එදා රෝම අධිරාජ්‍ය තුළ අයුක්තිය, අසාධාරණය, බලහත්කාරය මෙන්ම ලිංගික අපචාර වැනි මිනිස් ආධිපත්‍යය මුදුන්පත්වූ යුගයක් තිබුණි. ජීවිත බිඳවැටී, ශිෂ්ඨාචාරය පහත වැටී තිබූ යුගයක ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනය , දිළින්දන් තුළ ඉමහත් බලාපොරොත්තුවක් ඇතිකරමින් නව යුගයක් උදාකරනු ලැබීය.
 * අපගේ දේශය කෙරෙහි නෙත, සිත යොමු කරද්දී අප සමාජ තත්ත්වයද එසේම නොවේද? දිනෙන් දින මිනිස් ආත්මාර්ථය රජයන, පාප අන්ධකාරය නිසා බිඳවැටී ඇති මෙම තත්ත්වයට පිළිතුර කුමක්ද? අප අතරට වැඩම කළ, අප සමඟ වැඩ සිටින , මතු වඩින ජේසුස් ක්‍රිස්තුන් වහන්සේම ය.

05. ප්‍රායෝගික වීම සඳහා
 * (පිලිප්පි 2:5) "ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්පය ඔබ තුළත් පවතීවා!" අපගේ මුළු බලාපොරොත්තුවම ක්‍රිස්තුස් වහන්සේ වෙත තබමු. අත්හැරීමේ, ඉඩදීමේ, කියන දේ කිරීමේ, පූජා වීමේ ප්‍රේමයේ ලක්ෂණ අපගේ ජීවිතවල ප්‍රායෝගික කරමු.
 * ආගමන කාලයේ සුභාරංචිය තුළ ජීවත් වෙන්ට පටන් ගනිමු. දේව රාජ්‍යය පිළිබඳ දැක්මට ඇතුළු වෙමින්, අන් අයවද ඊට යොමු කරවමු.

06. අවසාන යැදුම
   * අලුත් උපතක් - අත්දකින්නට අවංක පිපාසයක් ඇති කර ගනිමු.
   * ඒ සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය පතා යාච්ඤා කරමු.
   * පුබුදු ගී අංක 178 "යුග ගණනක් පෙරුම් පුරා..."

========================

## 2018 දෙසැම්බර් මස 10 වන දින සිට දෙසැම්බර් මස 16 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

**"මනස්ස්ථාපනය වෙමින් ප්‍රීතියෙන් ක්‍රිස්තුන් වහන්සේව පිලිගැනීමට ඇති බාධා ඉවත් කර ගනිමු."**

01. ප්‍රශංසාව සඳහා
   * (ගීතාවලිය 126:1-2) සමිඳුන් අප මුදා ගෙන සියොනට ගෙනා කල අපට එය සිහිනයක් මෙන් විය. එවිට අප සිනහවෙන් ඉපිලී ගියෙමු. ප්‍රීතියෙන් ගීත ගායනා කළෙමු.
   * වැඩ සිටිය වැඩ සිටින මතු වඩින ක්‍රිස්තුස් වහන්සේ අප උදෙසා මහත් දේ සිදු කර ඇත. ගැළවීමේ උරුමය නැවත අපට හිමිකර දී ඇත. ඔවුන්වහන්සේගේ ශුද්ධවූ ප්‍රේමයේ ගුණ මහිමය මෙනෙහි කරමින්, අපි තුති පැසසුම් පුද කරමු. අප මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනමු.
   * පුබුදු ගී අංක 129 "පූර්ණයාණනි ඔබ දකින තුරා.."

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගනිමු.
   * දේව රාජ්‍යය වෙනුවෙන් සියල්ල අත්හරින්නට ඔබ/ මම පුබුදු ජනතාවක් ලෙස සූදානම්ද?
   * ක්‍රිස්තුස්වහන්සේ අපට ප්‍රකාශ කළ අත්හැරීමේ, ඉඩදීමේ, කියන දේ කිරීමේ පූජාවීමේ ප්‍රේමයට සහභාගිවීමට පෞද්ගලික වශයෙන්, පවුලක්, ශ්‍රාවක සංඝයක්, පුබුදු ජනතාවක් හැටියට ඔබ/ මම/ අපි සූදානම් ද?
   * පසු ගිය සතියේ සුභාරංචිය මුල් කරගෙන ඔබගේ අත්දැකීම සාංඝික කරගන්න.

03. සතියේ සුපුවත -
   "... පව්කමාව ලබන පිණිස මනස්ථාපනය වී බෞතිස්ම ස්නාපනය ලබන්නැ'යි ප්‍රකාශ කළේය. ..."
   * ශු. ලූක් 3:1-6 දක්වා ශුද්ධ ලියවිලි පාඨය කියවා ආගමන කාලයේ දෙවන සතිය මුල් කරගෙන දිව්‍යසිවරයා මඟින් ඔවුන්වහන්සේ අපට ආරාධනය කරන්නේ කිමෙක්දැ යි බෙදාගන්න. දෙවන හා තුන්වන වගන්ති කෙරෙහි විශේෂ අවධානය යොමු කරන්න.
   * දෙවියන්වහන්සේගේ පණිවුඩය පාළුකරයෙහි සෙකරියස්ගේ පුත් ජොහාන් වෙත පැමිණියේය...
   තවද ඔහු ජෝර්දාන් ගඟ අවට පෙදෙස මුළුල්ලේ සැරි සරමින් පව් කමාව පිණිස පසුතැවී සිත් හරවා ගෙන බෞතිස්ම ස්නාපනය ලබන්නැයි ප්‍රකාශ කළේය.

04. වචනයේ ස්වකයා සඳහා
   * ආගමන සමයේ දෙවන සතියේ සුපුවත මගින් අපගේ කිතුනු විශ්වාසය, බලාපොරොත්තුව ස්ථිර කරමින් සතුට ප්‍රීතිය අත්දකිනු සඳහා සුභාරංචිය ඉදිරිපත් කරමින් මනස්ථාපනය වී, වැඩ සිටිය, වැඩ සිටින, මතු වඩින ක්‍රිස්තුන් වහන්සේව ප්‍රීතියෙන් පිළිගන්නට සූදානම් වෙමු. මන්ද, ඔවුන් වහන්සේ මගින් අපට පව් කමාවත් මිදීමත් ලැබී ඇත. නව යුගයක් උදාවී ඇත.
   * ස්නාවක ජොහාන් තුමා දේශනා කළේ මනස්ස්ථාපය ගැනයි. මනස්ථාපනය යනු මූලිකවම දේව කැමැත්ත අනුව අලුත් උපතක් සඳහා දොරටුවක් විවෘත කර ගැනීමකි. එමඟින් ජීවිතයට නවෝදයක් ඇති කරගැනීමයි. එනම්, ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන පැමිණීම සඳහා අපගේ ජීවිත සූදානම් කරගැනීමත් අපට පැවරී තිබෙන ක්‍රිස්තු දූත කාර්යය මැනවින්, දේව කැමැත්තට අනුකූලව ඉටුකිරීමත්ය. දේව පුත්‍රභාවය තුළ ජීවත් වෙමින් අන් අයවද දේව කැමැත්ත කරන්නට යොමු කිරීමයි, පෙළඹවීමයි.

05. අප දෙස
   * ක්‍රිස්තුන් වහන්සේගේ දැක්ම අපගේ දැක්ම කරගැන්මට අවංක පිපාසයක් අප තුළ තිබේද යන්න විමසා බලන්න.
   * (බාරුක් 5:1) එම්බා ජෙරුසලෙම් නගරය, දුක් හා වේදනාවේ වස්ත්‍රය ඉවත ලා දෙව් මහිමයේ ශෝබනකම සදහටම ඇඟලා ගන්න. මේ සඳහා අවංක වූ පිපාසයක් ඔබ තුළ/ මා තුළ තිබේද?
   * අප දේශය තුළ දේශපාලන ක්ෂේත්‍රය දිහා බලන්න. මඩ ප්‍රහාර, පවාදීම්, අයුතුකම් අසාධාරණකම්, නොපනත්කම්, සදාචාරයට පටහැනි බොහෝ දේ සිදුවෙමින් පවති. එසේම සමාජය පරිසරය තුළ දිනෙන් දින පාපිෂ්ඨකම් රජ කරයි. ජීවිත විනාශ වෙමින් පවති. පුරවැසියන් බොහෝ දෙනා උදාසීන තත්ත්වයකට ඇද වැටී ඇත.
   * දිවැසිවරයා මඟින් සමිඳාණන් වහන්සේ ආගමන කාලයේ දෙවන සතිය තුළ ගැඹුරු මනස්ස්ථාපනයක් සඳහා අපව කැඳවයි. මනස්ස්ථාපනය යනු දෙවි රජය රජ කරවන්නට බාධා කරන සියල්ල කුණුකසල සේ සලකා ක්‍රිස්තුන් වහන්සේ වෙත මුළු සිතින් හැරී ඒමයි.

06. ප්‍රායෝගික වීම සඳහා
   i මෙවන් යුගයක ශ්‍රාවක අපගේ වගකීම හා කැඳවීම කිමෙක්ද? දේශය වෙනුවෙන් සමිඳාණන්වහන්සේ අපට කුමක් පවසනවාද යන්න යාච්ඤාව තුළ විමසමු.
   ii ක්‍රිස්තුන් වහන්සේගේ දැක්ම අන් අය සමග බෙදාගනිමින් ඔවුන් එකිනෙකා දැනුවත් කරමු.
   iii නත්තලේ සැබෑ අරුත අපගේ ජීවිතවලට අයිති කර ගනිමින් අර්ථාන්විත නත්තලක් ගත කිරීමට පියවර ගනිමු.
   iv සැබෑ අධ්‍යාත්මික ප්‍රීතිය භුක්ති විඳීමට පිපාසයක් ඇතිකර ගනිමු.

07. අවසාන යැදුම - පුබුදු ගී අංක 178 "යුග ගණනක් පෙරුම් පුරා"

===========================

## 2018 දෙසැම්බර් මස 17 වන දින සිට දෙසැම්බර් මස 23 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

**"තමන් වහන්සේම ත්‍යාජ කර ගනිමින්, වහලෙකුගේ ස්වරූපයක් ගෙන, අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක"** (පිලිප්පි 2:7)

01. ප්‍රශංසාවට හැඳින්වීම :
   * පුබුදු ගී අංක 11 "සුදතුම් මඟුලයි - සුරිඳුන් බලයයි ...." මෙම ගීයත් සමඟ ප්‍රශංසාවට පිවිසෙමු.
   * අප ළඟා වී සිටින්නේ අති සුවිශේෂී කාලපරිච්ඡේදයක් වන, ආගමන සමයේ අවසන් සතිය වෙතයි. දේව පුත්‍රයාණෝ, ශුද්ධවූ ත්‍රිත්වයේ දෙවන තෙම වන ජේසු ක්‍රිස්තු සමිඳාණෝ, අපව සොයා පැමිණෙන බව ශුද්ධවූ සභා මාතාවෝ අප හට ප්‍රකාශ කරති. දේව බලය, දේව තේජස, දේව මහිමය (දේවත්වය නොව) හිස්කර ගනිමින් අප වෙත වඩින ඔවුන් වහන්සේ පිළිගන්නට අප කොතෙක් දුරට අවදි වී සිටිමුද? 'නත්තල' එනම් 'නව උපත' උරුම කරගන්නට ඔබට මට පමණක් නොව, මුළු විශ්වයටම උරුම කර දෙන්නට ඔබ මා කැඳවා ඇත. ඒ මහඟු කැඳවුමත් සමඟ දෙවි සමිඳු අභියස පෙනී සිටිමු.
   * පුබුදු ගී අංක 182 "හදකින් හදකට ගෙයකින් ගෙයකට නව උපතක් හිමි වේවා! ...." මෙම ගීයත් සමඟම අප සමඟ ජීවමානව වැඩ වසන ජේසු සමිඳුන් සමගින් දෙව් මහෝත්තමයාණන් පසසමු.

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගැනීම...

03. දවසේ සුපුවත :
   * පිලිප්පි 2: 5-8
   * කුඩා සංඝ ලෙස වෙන්වී මෙම පාඨය කියවා මේ පිළිබඳව සාංඝික කර ගනිමු.
   * ඉන්පසු කුඩා සංඝ කිහිපයක අත්දැකීම් පොදුවේ සාඝික කර ගනිමු.

04. අනාවරණය අයිතිකර ගනිමු :
   * නත්තල යන්නෙහි අර්ථය 'නව උපතයි' කිතු සමිඳුන්ගේ උපන් දිනයයි. එබැවින් 'නත්තල' ඔබටත්, මටත් අප සැමටත් නව උපතක් ළඟාකර දිය යුතුමය. නොඑසේනම්, අප, සමිඳාණන් වහන්සේගේ තවත් එක් 'නත්තලක් ' සැමරුවා පමණක් වීම වැළැක්විය නොහැකිය.

* ජේසු සමිඳුන් මෙලොවට වැඩම කරද්දීම අපට උගන්වන පාඩම කුමක්ද?
* පිලිප්පි 2:6,7 මෙයින් අපට අනාවරණය කරන්නේ ඔවුන් වහන්සේට උරුමව තිබූ දේව තේජස, දේව මහිමය, දේව බලය හිස්කර වහලෙකුගේ ස්වරූපය ගෙන අප හා සමාන මනුෂ්‍යයකු වූ බවයි. මනුෂ්‍යයාට සාංසික වූ බවයි.
* පිලිප්පි 2:8 මනුෂ්‍යයෙකු ලෙස සිටිමින්, කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක. දේව කැමැත්තට මුළුමනින් අවනත වූ සේක.
* ඔවුන් වහන්සේ දිළින්දන්ගේත් දිළින්දෙක් වෙමින් ගවහලක උපත ලබන මේ නත්තල අපට අනාවරණය කරන මහා අනාවරණය මෙය නොවන්නේද?

05. අප දෙසට : (ඔබගේ කුඩා සංඝ තුළ සාංඝික කරගන්න)
* ඔවුන් වහන්සේ අප වෙත ඉදිරිපත් කරන මේ අනාවරණය ඔබගේ මගේ ජීවිතයට බද්ධ කර ගන්නේ කෙසේද? මම මගේ සංඝයට සාංඝික වන්නට අත්හල යුතු දේ මොනවාද?
* සැබෑ නව උපතක් අත්දකින්නට, සමිඳාණෝ පියාණන් වහන්සේට කීකරු වුණාක් මෙන් අපගේ ජීවිත වල දෙවියන් වහන්සේට, අවනත කළ යුතු ජීවිතයේ විවිධ පැති මොනවාද?

06. අවසන් ප්‍රශංසාව :
* පිලිප්පි 2:5 "ක්‍රිස්තුන් ජේසුස් වහන්සේ තුළ පැවැති ජීවිත ආකල්පය ඔබ තුළත් පවතීවා."
* "මා අනුව එන්න" යන ඇරයුම, ඔවුන් වහන්සේ මෙන් වන්නටය. කිසිම පුද්ගලයෙකුට, කිසිම දෙයකට, පක්ෂවලට, පාටවලට ගැති නොවී නිවහල් ව, සියල්ලේදී සමිඳු අභිමතය අනුව දිවි ගෙවමින් දේව කැමැත්තට ආමෙන් කියන්නට අවශ්‍ය වරම් පතමින්, මුළු හදවතින් "මා අනුව එන්න" යන වදනට පිළිතුරු දෙන්නට අවැසි වරම් පතා අප එකිනෙකා වෙනුවෙන් යදිමු.

* පුබුදු ගී අංක 222 "ඔබයි මගේ දැඩි බලාපොරොත්තුව...."

========================

## 2018 දෙසැම්බර් මස 24 වන දින සිට දෙසැම්බර් මස 30 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

### "මා පියාණන්ගේ මැදුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නාහු ද?"

01. ප්‍රශංසාවට හැඳින්වීම :
* පුබුදු ගී අංක 178 "යුග ගණනක් පෙරුම් පුරා..." මෙම ගීයත් සමග ඔබ ප්‍රශංසා ගමේ මෙදින ප්‍රශංසා එකතුවට පැමිණ සිටින සෑම දෙනා අතර සුභ නත්තලක් වේවා! නව උපතක් අත්වේවා! යනුවෙන් සුභ පතන්නට අවස්ථාව ගන්න.
* පුබුදු ගී අංක 7 "සුදත් සුරිඳුනේ අප සිත් සනසා...." මෙම ගීයත් සමග ප්‍රශංසාවට පිවිසෙමු.
* අප පිවිස සිටින්නේ ඉතාම සුවිශේෂී සතියකටයි. සමිඳාණන් වහන්සේගේ නත්තල් මංගල මහෝත්සවය, ශුද්ධවූ පවුලේ මංගලෝත්සවය මේ සතියට යෙදී ඇත. ඒ සමගම 2018 වසරේ නිමාවත්, 2019 වසරේ ආරම්භයත් මේ දිනවලට සමීපව යෙදී ඇත.
* මේ සියල්ල තුළින් මහඟු දෙව් වරම් හා ආසිරි ලබා දෙන දෙව් මහෝත්තමයාණන් වහන්සේට අපගේ හදපත්ලෙන් නැගෙන ස්තුතියත්, ප්‍රශංසාවත් පුදකරමු.
* පුබුදු ගී අංක 84 "උදේ හවා දිවා රැයේ නැගේ හඬක් මගේ හදින්..." මෙම ගීය සමඟ ශුද්ධාත්ම වරම් දීමනා අත්දකින ප්‍රශංසාවකට පිවිසෙමු.

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගැනීම...

03. දවසේ සුපුවත :
* ශු. ලූක් 2:44-52 (ලබන ඉරිදා ශුද්ධවූ පවුලේ මංගල දින ශු. සුවිශේෂ ප්‍රකාශය)
* කුඩා සංඝ ලෙස වෙන්වී මෙම පාඨය කියවා මේ පිළිබඳව සාංඝික කර ගනිමු.
* ඉන්පසු කුඩා සංඝ කිහිපයක අත්දැකීම් පොදුවේ සාංඝික කර ගනිමු.

04. සාකච්ඡාව - කුඩා සංඝ ලෙස සාංඝික කර ගන්න.
* ශු. ලූක් 2:47 මෙහි දැක්වෙන අන්දමට සියල්ලෝ විස්මිත වූයේ ඇයි?
* ශු. ලූක් 2:48 මෙහි දැක්වෙන අන්දමට දෙමව්පියෝ මවිත වූයේ ඇයි?

* ශු. ලූක් 2:49 ජේසු සමිඳුන්ගේ පිළිතුර පිළිබඳව ඔබේ අදහස් බෙදා ගන්න.
ශු. ලූක් 2:51 "මෑණියෝ මේ සියල්ලක්ම සිත්හි නිදන් කර ගත්හ" මේ පිළිබඳ බෙදා ගන්න.

05. අප දෙසට : මොහොතක් මෙනෙහි කරමු.
* "මා පියාණන්ගේ මැදුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නාහු ද?"

- 2018 වසර පුරා, එදිනෙදා ජීවිත ගමන තුළ මා සිටියේ කොහේද?
- මා හට, අපේ පවුලට, අපේ සංඝයට තිබෙන ඇරයුම නිරන්තරයෙන් ඔවුන් වහන්සේගේ නිවහනේ, ඔවුන් වහන්සේ අභිමුව සිටින්නට නොවේද?

06. අවසන් ප්‍රශංසාව :
* මගේ සංඝය, මගේ දේශය වෙනුවෙන් මා සිටිය යුතු තැන සිටින්නට අවශ්‍ය වරම් පතා යදිමින් දෙවිඳුන් පසසමු.
* පුබුදු ගී අංක 192 "ඔසොවමි ඔබ වෙත මගේ අත්බව සමිඳුනි...."

==================

## 2018 දෙසැම්බර් මස 31 වන දින සිට 2019 ජනවාරි මස 06 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

### "දේව කැමැත්ත ඉටු වීමට ඉඩ හරිමු"

01. ආරම්භක ගීය : පුබුදු ගී අංක 131 " පුරා හදවතින් සිතා තුන් සිතින් "

02. ප්‍රශංසාවට යොමුව :
* ගෙවුනු නත්තලේ දී සමිදාණන් වහන්සේට අප තුළ, අප පවුල තුළ දැනුවත්වම ජනිත වීමට හැකි වුනාද? සමිදාණෝ නව වසරක් උදා කළේ දේව රාජ්‍යය ලොවට ගෙනයාමට කෙරෙන ඇරයුමක් ලෙස පිළිගත හැකි වුවාද? කුඩා කණ්ඩායම් තුළ සාංඝික කරගන්න. (කිහිපයක් පොදුවේ බෙදාගන්න)

* වසරක් ගෙවී නව වසරකට අපි පිවිස සිටින්නෙමු. පසුගිය වසර තුළ අප මුහුණ දුන් විවිධ සිද්ධීන්, ප්‍රශ්න, කරදර හමුවේ පියාණන් වහන්සේගේ රැකවරණය හා සුරක්ෂිත භාවය අප අත්දුටු අයුරු සිහි කරමු. එසේම දේව ආදරය අත්දැකීමට නොහැකිව වේදනාවට කනස්සල්ලට යටවූ අවස්ථාවන් ද මතකයට නංවා ගනිමු.

* නත්තලේ අරුතට පිටුපා ලෝකයේ වාණිජ රැල්ලට හසු වී එය ගත කළේ කෙසේද? ඒ ගැන මනස්ථාපනය වෙමු. පසුගිය වසරේ අප සමග ජීවත් වී මේ වන විට සමිඳු තුරුල්ලට කැඳවා ගත්තවුන් සිහි කරමු. අපගේ දුබලකම් කොතෙක් වුවද පියාණන් වහන්සේ අපට තවත් වසරක ආලෝකය දැකීමට දානය කළා වූ වරම සිහිකර ඔවුන් වහන්සේට ප්‍රශංසා කරමු. දීමනා වරම් අත්දකින ප්‍රශංසාවක යෙදෙමු.

03. සතියේ සුපුවත
* ජොර්දාන් නදියේ ස්නාපන සිදුවීමේ දිගහැරෙන දෙදෙනාගේ හමුවීම ඒ මොහොතේ සිදු වූවක් නොවේ. ස්නාවක ජොහාන් හා ජේසු සමිඳුන් මෙලොව එළිය දැකීමට පෙරාතුව සිට දැන හැඳින ගැනීමකි. " මාගේ ස්වාමින් වහන්සේගේ මෑණියන් මා වෙතට පැමිණීමට තරම් මම කවරෙක් ද? මක්නිසාද ඔබේ ආචාර හඬ මා සවන් ගත වූ කෙනෙහිම මා කුසේ දරුවා ප්‍රීතියෙන් ඉපිලී ගියේය". (ශු. ලූක් 1:43-44) ඒ මුල්ම හමුවීමය. එය දෙවියන් වහන්සෙගේ ශුද්ධවූ කැමැත්ත ඉටු වූ මොහොතකි.

* ස්නාවක ජොහාන් තුමන් හා ජේසු සමිඳුන් ද මෙලොවට එවීමේ නියමය ද දෙවියන් වහන්සේගේ ම ශුද්ධවූ අභිප්‍රායයි. දෙවියන් වහන්සේ ඒ සඳහා යොමු කරනු ලැබුවේ ඔවුන් වහන්සේගේ ස්වර්ගීය පණිවිඩකරු ගාබ්‍රියෙල් නම් සුරදූතයාණන්ය. " දේව දූතයා

පිළිතුරු දෙමින් දෙවියන් වහන්සේ අභිමුවෙහි සේවය කරන ගාබ්‍රියෙල් මම ය. මා එවන ලද්දේ ඔබ සමග කතා කරන්නටත් මේ සුභ ආරාංචිය පවසන්නටත් ය" (ශු. ලූක් 1:19). " සවැනි මස ගාබ්‍රියෙල් නම් දේව දූතයා දෙවියන් වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නම් නුවර විසූ, දාවිත් රජ පරපුරෙන් නැවත එන ජෝසප් නම් මනුෂ්‍යයෙකුට විවාහ ගිවිසුම් දී කාන්‍යාවක් වෙත යවන ලදී. ඒ කන්‍යාවගේ නම මරියා ය" (ශු. ලූක් 1:26-27) සමාජය තුළ වඳයයි සම්මත එළිසබෙත් තුමිය ද, ලාබාල තරුණියක් වූ දෙව් මවුන් ඇදැහිය නොහැකි සිදුවීමක් වුවද දේව කැමැත්ත ලෙස සලකා එය තමන් තුළ ඉටු වීමට ඉඩ දුන්නිය.

* ස්නාවක ජොහාන් තුමා ස්නාපනය සඳහා කැඳවූයේ පවුකරුවන් ය. පාපයෙන් පිරිසිදු වීමේ බාහිර ප්‍රකාශනයක් ලෙස දියේ ගිල්වීම සිදු කරන ලදී. තමන් හමුවට සෙසු ජනතාව සමග පැමිණෙන ජේසු සමිඳුන් දුරදීම දකිනා ස්නාවක ජොහාන් " මෙන්න ලෝකයේ පාපය දුරලන දෙවියන් වහන්සේගේ බැටළු පෝතකයාණෝ " (ශු. ජොහාන් 1:29) යනුවෙන් ජනතාවට සමිඳුන් හඳුන්වා දෙමින් " ඔබෙන් බෞතිස්ම- ස්නාපනය ලැබිය යුත්තේ මමය. එහෙත් ඔබ මා වෙත එන සේක්දැ යි ඇසීය. ජේසුස් වහන්සේ ඔහුට උත්තර දෙමින් දැනට ඉඩ දෙන්න. මෙසේ දේව කැමැත්ත මුළුමනින්ම ඉටු කිරීමට අපට සුදුසු යි වදාළ සේක". (ශු. මතෙව් 3:14-15)

* සමිඳුන් ජෝර්දාන් නදියේ දී දේව කැමත්ත ඉටු වීමට ඉඩ හැරීමෙන් ලබා ගත් "මොහු මාගේ ප්‍රියාදර පුත්‍රයාය. මොහු කෙරේ මම ඉතා ප්‍රසන්න වී සිටිම යි' ස්වර්ගයෙන් හඬක් නික්මිනි" (ශු. මතෙව් 3:17) දේව කැමැත්තට ඉඩ හැරීම ගැන ඔබගේ අත්දැකීම කුඩා කණ්ඩායම් තුළ සාකච්ඡා කරන්න.

04. අප දෙසට
* අප තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ සෑම ක්‍රියාවකදීම අප හදවතට එහි යහපත අයහපත සුදුසු නුසුදුසු බව අපට කතා කරන සේක. අප එය හෘද සාක්ෂිය ලෙස හඳුන්වමු.
* සැබවින්ම එය දේව කැමැත්ත බව දේව හඬ බව අයිති කරගෙන තිබේද? ඒ සඳහා සුදනුම් වරම් පතා යදිමු.

05. අවසන් ගීතිකාව :- පුබුදු ගී අංක 198 " කරුසියේ පුදසුනින්..."

==========================

## 2019 ජනවාරි මස 07 වන දින සිට 2019 ජනවාරි මස 13 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

### "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය; මම ඔබ ගැන ඉතා ප්‍රසන්න වී සිටිමි"

01. ආරම්භක ගීය : පුබුදු ගී අංක 100 "ඔබෙන් තොරවූ..."

02. ප්‍රශංසාවට යොමුව :
* සතිපතා සංසයක් ලෙසින් එක්වීම, ගෙවී ගිය සතිය තුළ දෙවියන්වහන්සේ විසින් අප තුළ, අප අතර සිදු කළා වූ සියලු දේ පිළිබඳ තුති පිදීමටය.
* අප එසේ තුති පිදිය යුත්තේ සියල්ල විකෘති වී, උඩියටිකුරු වී තිබෙන ලෝකය තුළ පවතින දේ ඒ අයුරින්ම දකිමින් සිදුකළ යුතු දේ පමණක් සිදු කිරීමට ලැබී ඇති කැඳවීම නිසාමය.
* සමිඳුන් මැවූ සියල්ල, සොබාදහම, සතා සිව්පාවුන් සමිඳුන් නියමය එලෙසින්ම ඉටු කරයි. එහෙත් තමන්වහන්සේගේම ස්වරූපයට හා සමානකමට මැවූ මිනිසා දේව නියමයට පිටුපා ක්‍රියා කර අයුක්තිය යුක්තිය ලෙස රජ කරවයි.
* මේ සියල්ල ඉදිරියේ ඔවුන් වහන්සේගේ ප්‍රසන්න දූ පුතුන් ලෙස ජීවත් වීමට අප ලබා ඇති මේ ජීවිතය කෙතරම් වාසනාවන්තද? ඒ ගැන සමිඳුන් පැසසිය යුතු නොවේද?
* පුබුදු ගී අංක 02 "නමෝ නමෝ ශුද්ධාත්මයාණනි" ගීයත් සමගින් දීමනා වරම් අත්දකින ප්‍රශංසාවක යෙදෙමු.
* අප ලබා ඇති මේ කැඳවීම ගැන කුඩා කණ්ඩායම් තුළ සාංසික කරගනිමු.

03. සතියේ සුපුවත

* ශු. මතෙව් 3:16-17 " ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබ එකෙණෙහිම දියෙන් ගොඩට ආ සේක. එවිට ස්වර්ගය විවර විය. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් පරවියෙකු මෙන් බසිමින් තමන් පිට පැමිණෙනු දුටු සේක. තවද "මොහු මාගේ ප්‍රියාදර පුත්‍රයාය. මොහු කෙරේ මම ඉතා ප්‍රසන්නව සිටිමි" යි ස්වර්ගයෙන් හඬක් නික්මිණි"

* ශු. මාක් 1:10-11 " ඔවුන්වහන්සේ දියෙන් ගොඩ නැගෙත්ම ස්වර්ගය විවර වී ආත්මයාණන් වහන්සේ පරවියෙකු මෙන් තමන් පිට බැස එනු දුටු සේක. තවද ස්වර්ගයෙන් නික්මුනු හඬක් "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය, ඔබ කෙරේ ඉතා ප්‍රසන්න වී සිටිමියි' පැවසීය"

* ශු. ලූක් 3:1-22 " ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලබා යාච්ඤා කරමින් සිටිය දී ස්වර්ගය විවර වී, ශුද්ධාත්මයාණන් පරවියෙකුගේ රූපාකාරයෙන් ඔවුන්වහන්සේ කෙරෙහි පහළ වූ සේක. එවිට "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි" හඬක් නික්මිණි".

* මෙම ශුද්ධ ලියවිලි පාඨ කුඩා කණ්ඩායම් තුළ කියවා ලැබෙන ආලෝකය සාංඝික කර ගන්න. කණ්ඩායම්වල ආලෝකයන් බෙදා ගන්න.

**වචනයේ සේවකයා සඳහා**

* සුවිශේෂකවරු තිදෙනාගේම වර්ථාවට අනුව මෙය ස්වර්ගය විවර වී ත්‍රිත්වයක් වූ දෙවියන්වහන්සේ මෙලොව ප්‍රකාශ වූ මොහොතකි. පියාණන් වහන්සේ හඬ, ශුද්ධාත්මයාණන් පරවියෙකුගේ රූපාකාරයෙන් පුත්‍රයාණන් මත පතිත විණි.
* පාපය නොදත් තැනැන්වහන්සේ පව්කරුවකු ලෙසින් දියට බැසීම තුළින් සැබෑ අනන්‍යතාව අයිති කර ගැනීම. ජලයේ ගිලුනේ මිනිස් පුතෙකි, ජලයෙන් ගොඩට එසවූයේ දේව පුතෙකි.
* මාංශගතවීම තුළ භාග්‍යවන්ත මාතාවන්ට හෙළිකල රහස "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාය" යන්න හෙළිකිරීම.
* සමිඳාණන්ගේ ස්නාපනය මොහොත පිළිබඳව ඔබගේ අත්දැකීම් කණ්ඩායම් තුළ සාංඝික කරගන්න.

04. සතිය පුරා

* ප්‍රසාද ස්නාපනයේදී, දැනුවත්ව අප ජීවිතවල ස්වාමීත්වය සමිඳාණන් වහන්සේට භාර දීමේදී අප දෙස බලා ඔවුන් වහන්සේගේ "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාය" යන හඬ අසන්න ආසා වෙමු. හැකි සෑම විටම එයට අවදිව සිටිමු.

* ඒ භාග්‍යවත් වරම ලබාදෙන ලෙස දිනපතා ශුද්ධාත්මයාණන් වහන්සේට නිරන්තර අවදිවීමේදී ඉල්ලා යදිමු.

05. අවසන් ප්‍රශංසාව

* පුබුදු ගී අංක 185 "ඔබ හා පිය නගනා..."

************************